# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2147/35 – 2019 ඔක්තෝබර් 29 වැනි අඟහරුවාදා – 2019.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2018 පෙබරවාරි මස 07 දින අංක 2057/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2018 අංක 35 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකයද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුලත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2017/HW/36.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: RBK/LAN/AQURE/A3/86.
2019 ඔක්තෝබර් මස 16 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිණිගොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 6 බී, ඉහළ වල්පොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොහොඹදෙනිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කේජී/ආර්එම්බී/2017/132 හා 2017.10.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හරක්ගාලේයාය – ප්‍රමාණය: හෙක්. 1.1978**
උතුරට: හරක්ගාලේයාය; නැගෙනහිරට: හරක්ගාලේයාය සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: හරක්ගාලේයාය.

02. **කැබලි අක්ෂර 'බී' – හරක්ගාලේයාය – ප්‍රමාණය: හෙක්. 1.8023**
උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ හරක්ගාලේයාය; නැගෙනහිරට: රඹුක්කන් ඔය; දකුණට: හරක්ගාලේයාය සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

11 - 981



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*